Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## පුත්තලම ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සහ පුත්තලම ප්‍රාදේශීය සභාවේ අනියම් තනතුරු සඳහා බඳවා ගැනීම

පුත්තලම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත විස්තර සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සහ ප්‍රාථමික ශිල්පීය සනයේ තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2008.11.19 හා 2009.05.12 යන දිනවල අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 03කට වැඩි කාලයක් ස්ථිර පදිංචියක් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *සේවක සනය* | *බඳවා ගන්නා ශ්‍රේණිය* | *බඳවා ගන්නා පදනම* | *බඳවා ගන්නා සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|---|---|
| ජල පොම්ප ක්‍රියාකරු | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III (PL 1) | ස්ථිර | 01 | 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410 |
| බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු | ප්‍රාථමික ශිල්පීය (PL 3) | III | ස්ථිර | 01 | 25,790-10x270-10x300-10x330-12x350 - රු. 38,990 |
| රියදුරු | ප්‍රාථමික ශිල්පීය (PL 3) | - | අනියම් / තාවකාලික | 01 | රා.ප.චක්‍රලේඛ 3/2016 පරිදි දෛනික වැටුපක් සහ අදල දීමනා ගෙවනු ලැබේ. |
| සෞඛ්‍ය කම්කරු | ප්‍රාථමික (ශිල්පීය නොවන) (PL 3) | - | අනියම් / තාවකාලික | 04 | රා.ප.චක්‍රලේඛ 3/2016 පරිදි දෛනික වැටුපක් සහ අදල දීමනා ගෙවනු ලැබේ. |

*ජල පොම්ප ක්‍රියාකරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :-*

i. *අධ්‍යාපන සුදුසුකම්.-* අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)

ii. *ශිල්පීය නිපුණතා .-* මෙම තනතුරේ කාර්ය භාරයට අදාලව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම හෝ රජයේ අනුමත බලධාරියෙකු විසින් නිකුත් කළ වෘත්තීය ප්‍රවීණතා සහතිකයන් ලබා තිබීම (අපේක්ෂිත ප්‍රවීනතාවයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.)

*බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :*

i. *අධ්‍යාපන සුදුසුකම් .-* අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් සමත්වී තිබිය යුතුය.

ii. *ශිල්පීය නිපුණතා .-* මෙම තනතුරේ කාර්ය භාරයට අදාලව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කල ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම හෝ රජයේ අනුමත බලධාරියෙකු විසින් නිකුත් කළ වෘත්තීය ප්‍රවීනතා බලපත්‍රයක් ලබා තිබීම.

iii. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කළ බරවාහන සහ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

*තාවකාලික/අනියම් රියදුරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :*

i. *අධ්‍යාපන සුදුසුකම්* .- අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුයි.

ii. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කළ බරවාහන සහ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

*තාවකාලික/අනියම් සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් :*

i. රජය විසින් අනුමත පාසලකින් 08 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත්ය.

*ඉහත සියළු තනතුරු සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

i. සියළු අයදුම්කරුවන් වයස අවුරුදු 18-45 ත් අතර විය යුතුය. (දැනටමත් වයඹ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරුවල සේවය කරන අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

ii. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා වසර 03 ක පළපුරුද්දක්ද, රියදුරු තනතුරු සඳහා වසර 3ක පළපුරුද්ද ද අවශ්‍ය වේ.

iii. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.

iv. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් විය යුතුය.

v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඩුවම් ලැබූවෙකු නොවිය යුතුය.

vi. පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03ක පදිංචිකරුවෙකු බව සනාථ කිරීමේ ග්‍රාම සේවා සහතිකය ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව ඉදිරිපත් කළ යුතුය.

vii. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවාගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය පුත්තලම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක සහ අදාල වන පරිදි වෘත්තීය ප්‍රවීණතාව තහවුරුකර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. දැනටමත් ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම්ගත සභාවේ සේවය කරන සේවකයින් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

ඉහත ස්ථිර තනතුරු සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් විය යුතුවේ. එම කාලය තුල සිය රාජකාරි වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදයක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය.

අනියම්/තාවකාලික පදනම මත බඳවාගන්නා සේවකයින්ට රා.ප. චක්‍රලේඛ උපදෙස් පරිදි වැඩකරන දින ගණන අනුව දෛනික වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

*අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

සියළුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරගත් අයදුම්පත් 2017.08.29 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, පුත්තලම ප්‍රාදේශීය සභාව, මදුරන්කුලිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුවේ.

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත
iii. අධ්‍යාපන සහතික
iv. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය

v. අදාළ වන පරිදි රියැදුරු බලපත්‍රය
vi. ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය
vii. අදාළ වන පරිදි රියැදුරකු වශයෙන් වසර 03කට වැඩි පළපුරුද්ද පිළිබඳ සේවා සහතිකය

ජේ. ඒ. සෝමසිරි ජයසිංහ,
ලේකම්,
පුත්තලම ප්‍රාදේශීය සභාව,
මදුරන්කුළිය.

2017 ජූලි මස 28 වැනි දින,
පුත්තලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***පුත්තලම ප්‍රාදේශීය සභාව***

*වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පුරප්පාඩු වී ඇති .......................... තනතුර සඳහා බඳවා ගැනීම සහ පුත්තලම ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක සේවා ගිවිසුම් මත .................................... තනතුර සඳහා බඳවා ගැනීම*

(ඉහත අදාළ නොවන ඡේදයන් කපා හරින්න)

කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි.

1. මුලකුරු සමග නම :——————————.
   (සිංහලෙන්/ඉංග්‍රීසියෙන්)
2. මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————.
   (සිංහලෙන්/ඉංග්‍රීසියෙන්)
3. ලිපිනය :
   i. පෞද්ගලික ලිපිනය:——————————.
   ii. රාජකාරි ලිපිනය :——————————.
4. දුරකථන අංකය :
   i. පෞද්ගලික දුරකථන අංකය :——————————.
   ii. රාජකාරි දුරකථන අංකය :——————————.
5. උපන් දිනය :——————————.
   2017.08.01 දිනට වයස :
   අවු.:—————— මාස :—————— දින:——————
6. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
7. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
8. අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය (ප්‍රථම/දෙවන/තෙවන)

විභාග අංකය :—————— වර්ෂය :—————— මාධ්‍යය :——————

| | *සමත්වූ විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| i. | ............................................ | ..................... |
| ii. | ............................................ | ..................... |
| iii. | ............................................ | ..................... |
| iv. | ............................................ | ..................... |
| v. | ............................................ | ..................... |
| vi. | ............................................ | ..................... |
| vii. | ............................................ | ..................... |
| viii. | ............................................ | ..................... |
| ix. | ............................................ | ..................... |
| x. | ............................................ | ..................... |

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය ඃ

විභාග අංකය :—————— වර්ෂය :—————— මාධ්‍යය :——————

| *සමත්වූ විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| i. ………………………………………… | ………………… |
| ii. ………………………………………… | ………………… |
| iii. ………………………………………… | ………………… |
| iv. ………………………………………… | ………………… |

09. වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද ඃ

………………………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………………………

10. දැනට යම් තනතුරක් දරන්නේනම් ඒ පිළිබඳ විස්තර ඃ

i. ආයතනයේ නම :…………………………………………
ii. තනතුර හා ශ්‍රේණිය:…………………………………………
iii. පත්වූ දිනය :…………………………………………
iv. සේවා සහතිකය :…………………………………………

11. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද මෙහි සපයා ඇති යම් තොරතුරක් වැරදි හෝ අසත්‍ය බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි.

…………………,
අයදුම්කරුගේ අත්සන.

දිනය :…………………….

12. ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................. මහතා/මහත්මිය ........................ වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම සහ හැසිරීම සතුටුදායක බවත්, ඉහත 01 සිට 10 දක්වා ශීර්ෂවල සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, 2017 ........................ මස ................................ වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

…………………,
ආයතන ප්‍රධානියාගේ/ඔහුගේ බලයලත් නිලධාරියාගේ
අත්සන හා මුද්‍රාව.

දිනය :…………………….